සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

# අ.පො.ස (උ.පෙළ) උපකාරක තක්සේරුව - 2026

**සංයුක්ත ගණිතය I**
**இணைந்த கணிதம் I**
**Combined Mathematics I**

**10 S I**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

| විභාග අංකය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|

**උපදෙස්:**

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ;
  **A කොටස** (ප්‍රශ්න 1 - 10) සහ **B කොටස** (ප්‍රශ්න 11 - 17).
- ✳ **A කොටස:**
  **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ පිළිතුරු, සපයා ඇති ඉඩෙහි ලියන්න. වැඩිපුර ඉඩ අවශ්‍ය වේ නම්, ඔබට අමතර ලියන කඩදාසි භාවිත කළ හැකි ය.
- ✳ **B කොටස:**
  ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඔබේ පිළිතුරු, සපයා ඇති කඩදාසිවල ලියන්න.
- ✳ නියමිත කාලය අවසන් වූ පසු **A කොටසෙහි** පිළිතුරු පත්‍රය, **B කොටසෙහි** පිළිතුරු පත්‍රයට උඩින් සිටින පරිදි කොටස් දෙක අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
- ✳ ප්‍රශ්න පත්‍රයෙහි **B කොටස පමණක්** විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| (10) සංයුක්ත ගණිතය I | | |
|---|---|---|
| **කොටස** | **ප්‍රශ්න අංකය** | **ලකුණු** |
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| B | 11 | |
| | 12 | |
| | 13 | |
| | 14 | |
| | 15 | |
| | 16 | |
| | 17 | |
| | **එකතුව** | |

**එකතුව**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

**සංකේත අංක**


| | | |
|---|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | | |
| පරීක්ෂා කළේ: | 1 | |
| | 2 | |
| අධීක්ෂණය කළේ: | | |

[දෙවැනි පිටුව බලන්න.

## A කොටස

**1.** **ගණිත අභ්‍යුහන මූලධර්මය** භාවිතයෙන්, සියලු $n > 1, n\epsilon\mathbb{Z}^+$ සඳහා $2^{2^n}$ මගින් දෙනු ලබන සංඛ්‍යාවේ අවසාන සංඛ්‍යාංකය 6 වන බව සාධනය කරන්න.

**2.** $y = a|x+b|+c$ හි ප්‍රස්තාරයේ දළ සටහනක් යාබද රූපයේ දී ඇත;මෙහි $a, b, c \in \mathbb{R}$ වේ. $a, b$ සහ $c$ හි අගයන් සොයන්න.
දී ඇති ප්‍රස්තාරය මත එකම ඛණ්ඩාංක අක්ෂ මත $y = |x+4|$ හි ප්‍රස්තාරයේ දළ සටහන අඳින්න.
**ඒ නයින්,** $x \in \mathbb{R}$ සඳහා $|x+4| + |x-2| = 6$ සමීකරණය විසඳන්න.



විභාග අංකය

**3.** එක ම ආගන්ඩ් සටහනක,

(i) $|z-1|=1$ හා

(ii) $|\text{Arg}\,(z-1)|=\dfrac{\pi}{3}$


සපුරාලන $z$ සංකීර්ණ සංඛ්‍යා නිරූපණය කරන ලක්ෂ්‍යවල පථයන්හි දළ සටහන් අඳින්න.

**ඒ නයින්,** මෙම පථයන්හි ඡේදන ලක්ෂ්‍යය මගින් නිරූපණය කරනු ලබන සංකීර්ණ සංඛ්‍යා $r(\cos\theta+i\sin\theta)$ ආකාරයෙන් ලියා දක්වන්න; මෙහි $r>0$ හා $-\pi<\theta\leq\pi$ වේ.

**4.** $n\in\mathbb{Z}^+$ යැයි ගනිමු. $(1+x)^n$ හි ද්විපද ප්‍රසාරණයේ අනුයාත පද තුනක සංගුණක සමාන්තර ශ්‍රේණියක පිහිටයි නම්, $n+2$ පූර්ණ වර්ගයක් බව පෙන්වන්න.

**5.** $\lim_{x\to 0} \dfrac{1-\sqrt{\cos(\pi x)}}{\sqrt{1+5x^2}-\sqrt{1+2x^2}} = \dfrac{\pi^2}{6}$ බව පෙන්වන්න.

**6.** $2x-\pi y=0$ හා $y=\sin x$ වක්‍ර මගින් ආවෘත රූපයේ $R$ පෙදෙස $x-$ අක්ෂය වටා රේඩියන $2\pi$ වලින් භ්‍රමණය කරනු ලැබේ. මෙලෙස ජනනය වන ඝන වස්තුවේ පරිමාව $\dfrac{\pi^2}{12}$ බව පෙන්වන්න.



**7.** $0 < t < \frac{\pi}{2}$ සඳහා $x = e^{sint}$ සහ $y = e^{-\cos t}$ මගින් $C$ වක්‍රයක් පරාමිතිකව දෙනු ලැබේ.
$\frac{dy}{dx} = tan\, t \,.\, e^{-(\cos t + \sin t)}$ බව පෙන්වන්න. $C$ වක්‍රයට $x = e^{\frac{1}{\sqrt{2}}}$ අනුරූප ලක්ෂ්‍යයේ දී ඇඳි ස්පර්ෂකයේ අනුක්‍රමණය සොයන්න.

**8.** $P \equiv (\alpha, 3)$ යැයි ගනිමු; මෙහි $\alpha \in \mathbb{R}$ වේ. $l_1$ සරල රේඛාව $2x - y - 7 = 0$ සමීකරණය මගින් දී ඇත. $l_{1,}$ට ලම්භ $l_2$ සරල රේඛාවක් $P$ ලක්ෂ්‍යය හරහා ගොස් $x$ – අක්ෂය $R$ ලක්ෂ්‍යයේ දී ඡේදනය කරයි. $PR$ රේඛා ඛණ්ඩයේ මධ්‍ය ලක්ෂ්‍යය $x + y = 5$ සරල රේඛාව මත පිහිටයි නම් $\alpha$ හි අගය සොයන්න.

**9.** $A \equiv (2,1)$ ලක්ෂ්‍යය අනුබද්ධයෙන් $x^2 + y^2 + 2gx + 2fy + 60 = 0$ වෘත්තයේ ස්පර්ශ ජ්‍යාය $x - y = 10$ වන පරිදි $g$ හා $f$ හි අගයන් සොයන්න. තව ද $A$ ලක්ෂ්‍යය හා ස්පර්ශක ලක්ෂ්‍ය හරහා ගමන් කරන් වෘත්තයේ සමීකරණය $x^2 + y^2 - 9x + 3y + 10 = 0$ බව පෙන්වන්න.

**10.** $n \in \mathbb{Z}$ සඳහා $\theta \neq \frac{n\pi}{2}$ ලෙස ගනිමු.

$\frac{\sec^2\theta - \cos 2\theta + \tan^2\theta}{2\tan\theta + \sin 2\theta} = \sqrt{3}$ විසඳන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අ.පො.ස (උ.පෙළ) උපකාරක තක්සේරුව - 2026

සංයුක්ත ගණිතය I
இணைந்த கணிதம் I
Combined Mathematics I

10 S I

## B කොටස

**✱ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**11.** (a) $x \in \mathbb{R}$ සඳහා $f(x) = px^2 + qx + r$ යැයි ගනිමු; මෙහි $p > 0$ සහිතව $p, q, r \in \mathbb{R}$ වේ.

$f(x) \geq \dfrac{4pr - q^2}{4p}$ බව පෙන්වන්න.

දැන් $f(x) = x^2 - 2x - a^2 + 1$ හා $g(x) = x^2 - 2(a+1)x + a(a-1)$ යැයි ගනිමු; මෙහි $x \in \mathbb{R}$, $a \in \mathbb{Q}^+$ වේ. $[f(x)]_{අවම}$ සහ $[g(x)]_{අවම}$ යනු පිළිවෙළින් $f(x)$ සහ $g(x)$ හි අවම අගයන් වේ. $a$ ඇසුරෙන් $[f(x)]_{අවම}$ අගය සොයන්න.

තවදුරටත් $[g(x)]_{අවම} - [f(x)]_{අවම} \geq 3$ වන පරිදි $a$ ට ගත හැකි අගය පරාසය සොයන්න.

$f(x) = 0$ සහ $g(x) = 0$ සමීකරණවලට තාත්වික ප්‍රභින්න මූල දෙකක් පවතින බව පෙන්වන්න.

$\alpha$ සහ $\beta (>\alpha)$ යනු $f(x) = 0$ හි මූල යැයි ගනිමු. $\alpha$ සහ $\beta$ පරිමේය බව පෙන්වන්න.

$f(x) = 0$ හි මූල $g(x) = 0$ හි මූල අතර පිහිටයි නම් $0 < a < 1$ බව පෙන්වන්න.

(b) $f(x)$ යනු $x$ හි බහුපද ශ්‍රිතයක් හා $f'(x)$ යනු $f(x)$ හි ව්‍යුත්පන්න යැයි ගනිමු. $f(x)$ යන්න $(x-a)^2$ මගින් බෙදූ විට ශේෂය $(x-a)f'(a) + f(a)$ බව පෙන්වන්න; මෙහි $a \in \mathbb{R}$ වේ.

$x \in \mathbb{R}$ සඳහා $g(x) = 3x^3 + \lambda x^2 + \mu x - 6$ යැයි ගනිමු; මෙහි $\lambda, \mu \in \mathbb{R}$ වේ. $g(x)$ යන්න $(x-1)^2$ මගින් බෙදූ විට ශේෂය $-12x - 8$ වේ. $\lambda = -4$ බව පෙන්වා $\mu$ හි අගය සොයන්න.

$\lambda$ සහ $\mu$ හි මෙම අගයන් සඳහා $(x+1)$, $g(x)$ හි සාධකයක් බව පෙන්වන්න.

**ඒ නයින්,** $g(x)$ යන්න රේඛීය සාධකවල ගුණිතයක් ලෙස ප්‍රකාශ කරන්න.

**12.** (a) පිරිමි ළමුන් තිදෙනෙක් සහ ගැහුණු ළමුන් තිදෙනෙකුගෙන් සමන්විත සිසුන් සය දෙනෙකු බැගින් පාසල් දෙකකින් වැඩමුළුවකට සහභාගී වේ.

(i) I. කිසිදු සීමා කිරීමක් නොමැති නම්,

II. කමිටුවෙ හි සිටින පිරිමි හා ගැහැණු සංඛ්‍යාව සමාන නම් හා එක් එක් පාසලෙන් කමිටුවෙහි සිටින සිසුන් සංඛ්‍යාව සමාන නම්,

ඉහත සිසු කණ්ඩායම අතරින් සය දෙනෙකුගෙන් සමන්විත වන කමිටුවක් ආකාර කීයකින් සැකසිය හැකිවේ ද?

(ii) වැනිලා රසැති කිරි බෝතල් පහක්, චොකලට් රසැති කිරි බෝතලයක් සහ ස්ට්‍රෝබෙරි රසැති කිරි බෝතලයක් එක් අයෙකුට **හරියට ම** එක් බෝතලයක් ලැබෙන සේ කමිටු සාමාජිකයින් අතර ආකාර කීයකින් බෙදා දිය හැකිවේ ද?

[අටවැනි පිටුව බලන්න.

(b) $\frac{3^2-2.1}{1.3}\left(\frac{1}{3}\right)+\frac{5^2-2.2}{3.5}\left(\frac{1}{3}\right)^2+\frac{7^2-2.3}{5.7}\left(\frac{1}{3}\right)^3+\ldots$ ශ්‍රේණියේ $r$ වන පදය $U_r$ ලියා දක්වන්න.

$r\in\mathbb{Z}^+$ සඳහා $\frac{4r^2+2r+1}{(2r-1)(2r+1)}$ හි භින්න භාග සැලකීමෙන්,

$r\in\mathbb{Z}^+$ සඳහා $U_r=\left(\frac{1}{3}\right)^r+f(r)-f(r+1)$ වන පරිදි $f(r)$ සොයන්න.

**ඒ නයින්,** $n\in\mathbb{Z}^+$ සඳහා $\sum_{r=1}^{n}U_r=1-\left(\frac{n+1}{2n+1}\right)\left(\frac{1}{3}\right)^n$ බව පෙන්වන්න.

$\sum_{r=1}^{\infty}U_r$ අපරිමිත ශ්‍රේණිය අභිසාරී බව පෙන්වා එහි ඓක්‍යය සොයන්න.

**13.** (a) $\mathbf{A}=\begin{bmatrix}2 & 5\\-3 & 1\end{bmatrix}$ හා $\mathbf{B}=\begin{bmatrix}\frac{1}{17} & q\\ r & s\end{bmatrix}$ යැයි ගනිමු; මෙහි $q,r,s\in\mathbb{R}$ වේ.

(i) $q,r$ හා $s$ ඇසුරෙන් $\mathbf{AB}$ සොයන්න.

(ii) $\mathbf{AB}=\begin{bmatrix}k & k-1\\k-1 & k\end{bmatrix}$ වන පරිදි $q,r,s$ හා $k$ සොයන්න. තව ද $\mathbf{A}$ න්‍යාසයේ ප්‍රතිලෝමය $\mathbf{A}^{-1}$ සොයන්න.

(iii) පහත සමගාමී සමීකරණ යුගල න්‍යාස ආකාරයෙන් ලියා දක්වන්න. **ඒ නයින්,** සමීකරණ විසඳන්න.

$2x+5y=12$

$-3x+y=-1$

(b) $z_1,z_2\in\mathbb{C}$ යැයි ගනිමු. $z_1=\frac{1+i}{1-i}$ හා $z_2=\frac{\sqrt{2}}{1-i}$ යන්න $a+ib$ ආකාරයෙන් හා $r(\cos\theta+i\sin\theta)$ ආකාරයෙන් ප්‍රකාශ කරන්න; මෙහි $r>0$ හා $0<\theta<\frac{\pi}{2}$ .

$A,B$ යනු ආගන්ඩ් සටහනක් මත පිළිවෙළින් $z_1,z_2$ සංකීර්ණ සංඛ්‍යා නිරූපණය වන්නේ යැයි ගනිමු. $\mathrm{Arg}(z_1+z_2)=\frac{3\pi}{8}$ බව පෙන්වන්න. $\tan\frac{3\pi}{8}=1+\sqrt{2}$ බව **අපෝහනය** කරන්න.

(c) $\omega=\cos\frac{2\pi}{7}+i\sin\frac{2\pi}{7}$ යැයි ගනිමු. ද මුවාවර් ප්‍රමේයය භාවිතයෙන්, $\omega^7$ හි අගය සොයන්න.

**ඒ නයින්,** $1+\omega+\omega^2+\omega^3+\omega^4+\omega^5+\omega^6=0$ බව පෙන්වන්න.

$\omega^2+\omega^5=2\cos\frac{4\pi}{7}$ බව තවදුරටත් පෙන්වන්න. $\omega+\omega^6$ හා $\omega^3+\omega^4$ සඳහාත් එවැනි ම ප්‍රකාශන ලබාගන්න. **ඒ නයින්,** $\cos\frac{2\pi}{7}+\cos\frac{4\pi}{7}+\cos\frac{6\pi}{7}=-\frac{1}{2}$ බව පෙන්වන්න.

**14.** (a) $x \in \mathbb{R}-\{2\}$ සඳහා $f(x)=\dfrac{x^2+ax+3}{(x-2)^2}$ යැයි ගනිමු; මෙහි $a \in \mathbb{R}$ **වේ.**

$f(x)$ හි ව්‍යුත්පන්නය, $f'(x)$ යන්න $x \in \mathbb{R}-\{2\}$ සඳහා $f'(x)=\dfrac{-(a+4)x-(2a+6)}{(x-2)^3}$ මගින් දෙනු ලබන බව පෙන්වන්න.

$y = f(x)$ ප්‍රස්තාරයට $x = 1$ හි දී ස්ථාවර ලක්ෂ්‍යයක් ඇති **බව දී ඇත. ඒ නයින්,** $a$ හි අගය සොයන්න. තව ද $f(x)$ වැඩිවන ප්‍රාන්තරය හා $f(x)$ අඩුවන ප්‍රාන්තර සොයන්න.

$f(x)$ හි ස්ථාවර ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක ද සොයන්න.

$x \in \mathbb{R}-\{2\}$ සඳහා $f''(\mathrm{x})=\dfrac{2(2x-1)}{3(x-2)^4}$ **බව දී ඇත. ඒ නයින්,** $y = f(x)$ ප්‍රස්තාරයට නතිවර්තන ලක්ෂ්‍යයක් පවතින බන පෙන්වන්න. තව ද නතිවර්තන ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක ද සොයන්න.

ස්පර්ශෝන්මුඛ, ස්ථාවර ලක්ෂ්‍යය හා නතිවර්තන ලක්ෂ්‍යය දක්වමින් $y=f(x)$ හි ප්‍රස්ථාරයේ දළ සටහනක් අඳින්න.

(b) කේන්ද්‍රික ඛණ්ඩයක හැඩයට නමන ලද $l$ දිගැති තුනී කම්බියක් සම්පූර්ණයෙන් ම යොදාගනිමින් කරාබුවක් සාදා ඇත. කරාබුව මගින් ආවරණය කළහැකි උපරිම ක්ෂේත්‍රඵලය, සමාන දිගැති කම්බියකින් සාදන ලද සමචතුරස්‍රයක ක්ෂේත්‍රඵලය ට සමාන වන බව පෙන්වන්න.

**15.** (a) $\sqrt{2x}=t$ ආදේශය භාවිතයෙන්,

$$\int \frac{1}{x\sqrt{2x}\ +\ 4}\,dx$$ අගයන්න; මෙහි $x>0$.

(b) $I=\displaystyle\int_0^3 x\tan^{-1}\sqrt{x}\,dx$ ලෙස ගනිමු. කොටස් වශයෙන් අනුකලනය භාවිතයෙන් $I=\dfrac{3\pi}{2}-\dfrac{1}{4}J$ බව පෙන්වන්න; මෙහි $J=\displaystyle\int_0^3 \frac{x^{\frac{3}{2}}}{1+x}\,dx$ වේ.

සුදුසු ආදේශයක් භාවිතයෙන් $J=\dfrac{2\pi}{3}$ බව පෙන්වන්න. **ඒ නයින්,** $I$ අගයන්න.

(c) $k$ නියතයක් වන $\displaystyle\int_0^k f(x)\,dx=\int_0^k f(k-x)\,dx$ සූත්‍රය භාවිතයෙන්,

$$\int_0^{\pi} x\,sec^{2n+1}x\,tan\,x\,dx=\frac{\pi}{2}\int_0^{\pi} sec^{2n+1}x\,tan\,x\,dx$$ බව පෙන්වන්න. මෙහි $n \in \mathbb{N}$ වේ.

**ඒ නයින්,** $\displaystyle\int_0^{\pi} x\,sec^{2n+1}x\,tan\,x\,dx$ අගයන්න.

**16.** $l_1 \equiv ax+by+c=0$ හා $l_2 \equiv px+qy+r=0$ සරල රේඛාවල ඡේදන ලක්ෂ්‍යය හරහා යන සරල රේඛාවක සමීකරණය $l_1+\lambda l_2=0$ මගින් දෙනු ලබන බව පෙන්වන්න; මෙහි $\lambda$ යනු පරාමිතියකි.

$l_1 \equiv 4x-3y-1=0$ හා $l_2 \equiv 3x-4y+2=0$ යැයි ගනිමු. $l_1=0$ හා $l_2=0$ සරල රේඛාවල ඡේදන ලක්ෂ්‍යය හරහා යන සරල රේඛාවේ සමීකරණය පරාමිතික ආකාරයෙන් ලියන්න.

**ඒ නයින්,** $l_1$ හා $l_2$ සරල රේඛා ඡේදන වන ලක්ෂ්‍යය හා $P \equiv \left(3, \frac{22}{7}\right)$ ලක්ෂ්‍යය හරහා යන $l=0$ සරල රේඛාවේ සමීකරණය සොයන්න.

$l_1$ හා $l_2$ සරල රේඛා අතර කෝණ සමච්ඡේදකවල සමීකරණ සොයන්න. **ඒ නයින්,** $l_1$ හා $l_2$ සරල රේඛා අතර සුළු කෝණයේ සමච්ඡේදකය $l=0$ බව පෙන්වන්න.

$l_1$ හා $l_2$ සරල රේඛා දෙකම ස්පර්ෂ කරන හා කේන්ද්‍රය $(-2,\alpha)$, $\alpha \in \mathbb{Z}$ වන, $S_1$ වෘත්තයේ සමීකරණය $25x^2+25y^2+100x-250y+149=0$ බව ද පෙන්වන්න.

කේන්ද්‍රය මූල ලක්ෂ්‍යයේ පිහිටි වෙනත් $S_2$ වෘත්තයක් $S_1$ වෘත්තය ප්‍රලම්භව ඡේදනය කරයි. $S_2$ හි අරය $\frac{\sqrt{149}}{5}$ බව පෙන්වන්න.

**17.** (a) $\sin A, \cos A, \sin B$, හා $\cos B$ ඇසුරෙන් $\sin(A+B)$ ලියා දක්වන්න.
**ඒ නයින්,** $\sin\left(\frac{\pi}{2} \pm \theta\right) = \cos\theta$ බව පෙන්වන්න. $\cos\left(\frac{\pi}{2} - \theta\right) = \sin\theta$ බව **අපෝහනය** කරන්න.

$\sin(A+B)$ භාවිතයෙන් $\cos(A-B) = \cos A\cos B + \sin A\sin B$ බව පෙන්වන්න.
**ඒ නයින්,** සියලු $\theta \in \mathbb{R}$ සඳහා $sin^2\theta + cos^2\theta = 1$ **අපෝහනය** කරන්න.

$\sin\theta$, $\cos\theta$, $\tan\theta$ ගුණෝත්තර ශ්‍රේණියක අනුයාත පද වේ නම් $cos^3\theta = sin^2\theta$ බව පෙන්වන්න. $cos^9\theta + 3cos^8\theta + 3cos^7\theta + cos^6\theta - 1 = 0$ බව **අපෝහනය** කරන්න.

(b) සුපුරුදු අංකනයෙන්, $ABC$ ත්‍රිකෝණයක් සඳහා **සයින් නීතිය** ප්‍රකාශ කරන්න.

$ABC$ ත්‍රිකෝණයේ $B\hat{A}C$ කෝණ සමච්ඡේදකය $BC$ පාදය D හි දී හමු වේ. $BD:DC = \lambda+1:\lambda, \lambda > 0$ **බව දී ඇත.** $\frac{sin\ B}{sin\ C} = \frac{3}{4}$ නම් $\lambda$ හි අගය සොයන්න.

ත්‍රිකෝණවල වර්ගඵල සැලකීමෙන් හෝ **අන් අයුරකින්,** $4ca\sin B + 3ab\sin C = 7bc\sin A$ බව පෙන්වන්න. **ඒ නයින්,** $C = \frac{\pi}{4}$ නම් $\sin B + \cos B = \frac{3}{7}\left(\frac{ab+ca}{bc}\right)$ බව **අපෝහනය** කරන්න.

(c) $xy=1$ **බව දී ඇත.** $x, y \in \mathbb{R} - \{0\}$ සඳහා $\tan^{-1}x + \tan^{-1}y$ සොයන්න.

***